පරිසර

# නගරයක් මැද පිහිටි රාජකීය වනාන්තරය උඩවත්තකැලේ

මහනුවර ශ්‍රී දළදා මාළිගාවට ආසන්නයේ ම ඊට ඉස්මත්තෙන් පිහිටා ඇති උඩවත්ත කැලේ මහනුවර රජකම් කළ සියළුම රජවරුන් විසින් මහත් සේ ආරක්ෂා කළ මහනුවර රජ මාලිගයේ ම කොටසක් වශයෙන් සැලකුණු වනාන්තරයක් විය.

ශ්‍රී ලංකාවේ ඉතාම වැදගත් හා වටිනාම ස්වාභාවික සම්පත නිසැක වශයෙන් අපගේ වනාන්තර වේ. ජෛව විවිධත්වය හා වෙනත් බොහෝ සම්පත් රැඳී පවතින්නේ වනාන්තර නිසාවෙනි. ශ්‍රී ලංකාවේ වනාන්තර ජෛව සම්පත් අතින් ඉතා ඉහළ මට්ටමක පවතින බවට ජාත්‍යන්තර වශයෙන්ද පිළිගැනීමක් ඇති අතරම, අප රටට පමණක් ආවේණික සත්ව හා ශාක විශේෂ විශාල සංඛ්‍යාවකටද එම වනාන්තර නිජබිම වී ඇති බවද රහසක් නොවේ. එබඳු වනාන්තර ගැන සඳහන් කරන විට ඓතිහාසික තොරතුරු හා සමහරවිට ජනප්‍රවාද මගින් ද මහත් වැදගත්කමක් ලබා ඇති උඩවත්ත කැලයද අමතක කළ නොහැකි ස්ථානයකි. උඩවත්ත කැලේ පිහිටා ඇත්තේ, ආගමික, ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා සෞන්දර්යාත්මක අගයෙන් අගනැත්පත් ශ්‍රී ලංකාවේ වැදගත් පෞරාණික හා ලෝක උරුම නගරයන් වන මහනුවර ආශ්‍රිතව ය. මහනුවර ශ්‍රී දළදා මාළිගාවට ආසන්නයේ ම ඊට ඉස්මත්තෙන් පිහිටා ඇති උඩවත්ත කැලේ මහනුවර රජකම් කළ සියළුම රජවරුන් විසින් මහත් සේ ආරක්ෂා කළ මහනුවර රජ මාලිගයේ ම කොටසක් වශයෙන් සැලකුණු වනාන්තරයක් විය.

**යූ.පී.එස්. පතිරණ**



ලෝක උරුම ස්ථානයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති සිංහරාජ වැසි වනාන්තරය ශ්‍රී ලංකාවේ ඉතා වැදගත් ම වනාන්තරය බවට විවාදයක් නොමැති නමුදු උඩවත්ත කැලයට ශ්‍රී ලංකා ඉතිහාසයේ වඩාත් විශේෂ ස්ථානයක් හිමිවී තිබේ.

අතීතයේ දී උඩවත්ත කැලේ මායිම් මලබාර් වීදියේ (අනගාරික ධර්මපාල මාවතේ) සිට තැන්නකුඹුර පාලම දක්වාත්, ත්‍රිකුණාමල වීදියේ (ඩී.එස්.සේනානායක මාවතේ) සිට කටුගස්තොට පාලම දක්වාත් හා මහවැලි ගඟ දක්වාත් විහිදී පැවතිණි. එකල අක්කර 1000 ක පමණ භූමි ප්‍රමාණයකින් වැසී තිබූ එම වනාන්තරය අද අක්කර 252 දක්වා හැකිලී ඇත. එවක මහනුවර රජ කළ රජවරුන් හා රජ පවුලේ අය සඳහා පමණක් වෙන් වී තිබූ මෙම වනාන්තරය "තහනම් කැලේ" වශයෙන් කැලේ කෝරාළවරුන් විසින් ආරක්ෂා කරන ලදී. රජපවුලේ අයට ස්වභාව සෞන්දර්යය නැරඹීටත් එහි ඇති ඇළ දෙළ වලින් දිය නෑමටත් වෙන් වූ මෙම වනය රජවාසලට අවශ්‍ය දර සපයා ගැනීමට ද උපයෝගී කර ගත් බවක් පෙනී යයි.

කෙසේ වුවද, ජනතාවට මෙහි දර

ඇහිඳ ගැනීමට තහනම් වූ බවක් නොපෙනේ.

මෙම වනාන්තරයේ ඉතිහාසය වසර දහස් ගණනකට පෙර ආරම්භ වුවද, ප්‍රාග් ඓතිහාසික යුගයේදී මේ අවට ජනාවාසය තිබූ බවට සඳහනක් නොමැත. ශ්‍රී ලංකාව ජනාවාස කර ගත් ඉන්දීය - ආර්ය මුල් පදිංචිකරුවන් පළමුව දිවයිනේ ගංගා නිම්න ආශ්‍රිත පහත් බිම්වල ජනාවාස පිහිටුවාගත් අතර මහනුවර පුදේශය පිහිටි මධ්‍යම කඳුකරය වනාන්තර ගතව තිබූ බව පෙනී යයි. කෙසේ වුවද, කුරුණෑගල රජ පැමිණී පණ්ඩිත පරාක්‍රමබාහු ( ක්‍රි.ව. 1302 - 1326 ) තම රාජධානිය චෝල ආක්‍රමණයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා සුදුසු ස්ථානයක් සොයා බලන ලෙසට ඔහුගේ සෙන්පතියකු වූ සිරිවර්ධන කුමරුට අණකර කන්ද උඩරටට යවන ලද බව සඳහන් වේ. ගිරි ලෙනක ජීවත් වූ සෙංකඩ නම් වූ බ්‍රාහ්මණයකුගේ නමින් නම් කෙරුණ සෙංකඩගල පුරට පැමිණී සිරිවර්ධන කුමරු එහි රජුගේ රාජධානිය පිහිටුවීමට සුදුසු බව දැනුම් දුන් බව කියැවේ. එයින් පසු මහනුවර කෙමෙන් ජනාවාස වන්නට විය. ඉන්පසු ක්‍රි.ව. 1357 දී ගම්පොල රජ පැමිණී වික්‍රමබාහු රජුගේ මාලිගය මෙහි පිහිටුවනු ලැබ බව පෙනී යයි. මහනුවර ප්‍රථම රජු වශයෙන් සැලකෙන සේනා සම්මත වික්‍රමබාහු (ක්‍රි.ව. 1424 ද ) විසින් එහි වතුඩ වාසල නමින් හැඳින්වුනු සිය රජ මාලිගය මෙම වනය තුළ ගොඩ නගන ලදි. එය පිහිටි වනය එම නිසාම උඩවාසල වත්ත නමින් හැඳින්විය. පසුව උඩවත්ත කැලේ නමින් ව්‍යවහාරයට පැමිණී මෙම වනාන්තරය විදේශ ආක්‍රමණ වලදී රජුට ආරක්ෂාව සලසන කෙම්බිමක් විය. දෙල්ගමුව රජමහා විහාරයේ සඟවා තිබූ ශ්‍රී දන්ත ධාතුව පළමුවන විමලධර්මසූරිය රජුගේ ( ක්‍රි.ව. 1594 -1604) කාලයේ දී මහනුවරට ගෙනවුත් ශ්‍රී දළදා මාලිගාවේ තැන්පත් කිරීමත් සමඟ උඩවත්ත කැලේට ද විශේෂ වැදගත් කමක් හිමිවන්නට වූයේ නිතැතිනි.

උඩවත්ත කැලේ ප්‍රථම වන රක්ෂිතය ලෙස ප්‍රකාශයට පත් කර ඇත්තේ බ්‍රිතාන්‍ය යටත් විජිත සමය තුළ දීය. එනම්, 1893 දී ය. එය 1938



උඩවත්ත කැලේ ප්‍රථම වන රක්ෂිතය ලෙස ප්‍රකාශයට පත් කර ඇත්තේ බ්‍රිතාන්‍ය යටත් විජිත සමය තුළ දීය. එනම්, 1893 දී ය. එය 1938 දී සත්ව අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. මිනිස් අකටයුතුකම් නිසා විනාශ වුණු මෙම වනපෙතේ සමහර කොටස් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නැවත වගා කිරීමෙන් පසු වර්තමානයේ දක්නට ලැබෙන ආකාරයට උඩවත්ත කැලේ සැකසී තිබේ.

දී සත්ව අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. මිනිස් අකටයුතුකම් නිසා විනාශ වුණු මෙම වනපෙතේ සමහර කොටස් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නැවත වගා කිරීමෙන් පසු වර්තමානයේ දක්නට ලැබෙන ආකාරයට උඩවත්ත කැලේ සැකසී තිබේ.

මහනුවර වැවට හා මහවැලි ගඟට ජලය මුදා හරිනු ලබන ජල පෝෂක ප්‍රදේශයක් වශයෙන් ද වර්තමානයේ උඩවත්ත කැලේට වැඩි වැදගත් කමක් හිමිවී තිබේ. උඩවත්ත කැලේ අතීතයේ පවා අලියා, ගෝණා, මුවා, දිවියා , වැනි සතුන් නිදැල්ලේ හැසිරුණු වනයක් වුවද, මිනිස් ජනගහනයේ ව්‍යාප්තියත් මිනිස් ක්‍රියාකාරකමුත් නිසා බොහොමයක් එබඳු සතුන් දැන් උඩවත්ත කැලේ දක්නට නොමැත. කෙසේ වුවද, ශාක වියන් දෙකක් හා යටි ස්ථරයක් ද දැකිය හැකි හා පොළොව මතුපිටට ලැබෙන මද ආලෝකයක් සහිත මෙම උඩවත්ත කැලේ තුළ ශ්‍රී ලංකාවට ආවේණික ශාක හා සත්ව විශේෂ රැසක් ද හඳුනාගෙන තිබේ.

ආචාර්ය නිහාල් කරුණාරත්න වැනි විද්වතුන් කර ඇති පර්යේෂණ වලට අනුව උඩවත්ත කැලේ තුළ පක්ෂි විශේෂ 79 ක්ද, කෘමි විශේෂ 71 ක්ද, සමනල හා සලබ විශේෂ 32 ක් ද හඳුනාගෙන ඇත. මහාචාර්ය බාලසුබ්‍රමනියම් හා ඔහුගේ සිසු පිරිස් විසින් ඒක දේශික ශාක 9 ක් ද, ඇතුළුව ආසන්න වශයෙන් ශාක විශේෂ 400 ක් පමණ හඳුනාගෙන තිබේ. ඉන් අක්කර 9 ක පමණ භූමි ප්‍රදේශයක් තුළ පැතිරී පවතින පුස්වැල් (Lyriochapalusccutatus ) උඩවත්ත කැලේ දැකිය හැකි අසහාය ලක්ෂණයකි.

උඩවත්තේ සුලබව දැකිය හැකි ශාක අතරට වල්දෙල්, වනසපු, නා, කොස්, මහෝගනී, තුග, සපු, අන්කෙන්ද, තෙල් කැබැල්ල, කටු ඉඹුල්, නා ඉඹුල්, කිතුල්, මිල්ල, මා වේවැල්, මොර, උණ, නාවා, වල්ලා, දවට, කහට, තෙල් කැකුණ, ඇත් දෙමට, බදුල්ල, මී, ඇටඹ, දූරියන්, පිහිඹිය, මලබොඩ, කුරුඳු, වැල්ගම්මිරිස්, නියඟලා හා මදටිය ද ඇතුළත් වේ. එසේම, මෙහි දී මයිනා, කොට්ටෝරුවා, කොහා, ඇටිකුකුළා, අවිච්චියා, වල් අවිච්චියා, ගිනි කුකුළා, නීල කොබෙයියා, අළු කොබෙයියා, සර්ප උකුස්සා, බමුණු උකුස්සා, හිස කළු කහ කුරුල්ලා, සුදු රෙදි හොරා, සිවුරු හොරා, කොණ්ඩ උකුස්සා, රත් පිළිහුඩුවා, කුරුළුගොයා, වැහිලිහිණියා, ලංකා ගිරා මලිත්තා, ලංකා අළු ගිරවා, ලංකා හිස දුඹුරු දෙමලිච්චා, ලංකා මයිලගොයා, ලංකා අඳුරු නිල් මැසිමරා හා ලංකා රත් තළල් කොට්ටෝරුවා වැනි පක්ෂීන් සුලබව නිරීක්ෂණය කළ හැකි ය.

උඩවත්ත කැලේ පිහිටා ඇති වැදගත් ස්ථාන කිහිපයක් ද වේ. ක්‍රි. ව. 1834 දී එවක බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයාව සිටි ශ්‍රීමත් රොබට් විල්මට් හෝර්ටන් විසින් තනන ලද ඔහු ගේ බිරිඳ ගේ නමින් නම් කර ඇති ලේඩි හෝර්ටන් මාවත මෙම වනය තුළ ඉදි වූ ප්‍රථම මාවත වේ. මෙම වනය තුළ කඳු ගැට කිහිපයක් පිහිටා ඇති අතර, මුහුදු මට්ටමින් අඩි 1800 ක පමණ උසින් පිහිටි කොඩිමලේ ඉන් උසම ස්ථානය යි. 1803 දී ලේ වැල්ලේ දී සිදු වූ ඉංග්‍රීසි - සිංහල ගැටුමේදී මිය ගිය සොල්දාදුවන් හා සෙන්පතියන් සිහිවීම පිණිස මේජර් ඇඩම් ඩේවි විසින් ඉදිකරන ලද සොහොන් කොත් 163 ක් සහිත ගැරිසන් සොහොන ද වනරක්ෂණ කාර්යාලයට ඉහළින් පිහිටා තිබේ.

උඩවත්ත කැලේ ආශ්‍රිතව බෞද්ධ විහාරස්ථාන කිහිපයක් ද වේ. ඒ අතර වන සෙනසුන හා සේනානායක ආරාමය ද , තපෝවන විහාරය ද, සිරිවර්ධනාරාමය හා කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ( ක්‍රි.ව.1747 - 1782 ) විසින් ඉදිකරන ලද පුරාණ ගංගාරාම විහාරස්ථානය ද වේ.

වර්තමානයේ උඩවත්ත කැලේ මැනවින් සංරක්ෂණය හා නඩත්තු කෙරෙමින් වන සංරක්ෂන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රවනාගාරයකින් හා කෞතුකාගාරයකින් සමන්විත කාර්යාලයක් ද පවත්වා ගෙන යන අතර, එය නැරඹීමට පැමිණෙන්නන්ගෙන් ප්‍රවේශ ගාස්තුවක් ද අය කෙරේ. කෙසේ හෝ වේවා ජනාකීර්ණ නගරයක් මධ්‍යයේ පිහිටි සංරක්ෂිත වනාන්තරයක් වශයෙන් උඩවත්ත කැලේ අද දෙස් විදෙස් සංචාරකයන්ගේ , පරිසරවේදීන්ගේ , පර්යේෂකයන්ගේ හා පාසල් සිසු දරුවන්ගේ ජනප්‍රිය ආකර්ෂණයක් බවට පත් වී ඇති බව ද අවසාන වශයෙන් සඳහන් කළ යුතු ම ය.

❑